## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
**55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.**

### ඉතිහාසය කෙටියෙන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ෂ 1938 අංක 63 දරණ පාලන ආඥා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට රබර් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. නැවත 1956 අංක 11 පනත සම්මත වීමෙන් පසු වර්ෂ 1938 අංක 63 පනත බල රහිත විය. 1953 අංක 38 රබර් නැවත වගා සහනාධාර පනත යටතේ රබර් නැවත වගා සහනාධාර පනත යටතේ රබර් නැවත වගා සහනාධාර අරමුදල, රබර් නව වගාව හා නැවත වගාවට සහනාධාර සැපයීමේ අරමුණින් පිහිටුවන ලද අතර එම පනතේ විධිවිධානයන් 1955 අංක 1, 1956 අංක 54 හා 1998 අංක 09 යන පනත් මගින් පසුව සංශෝධනය විය.

රබර් පාලන දෙපාර්තමේන්තුව, රබර් පර්යේෂණ ආයතනයට අනුබද්ධව පැවති උපදේශක සභාව හා එක්ව 1994 දී වඩාත් ශක්තිමත් කර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙසින් නැවත නම් කරන ලදී.

### ප්‍රධාන අංශ

- පරිපාලන අංශය
- සංවර්ධන අංශය
- සැලසුම් අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### අරමුණු

- රබර් වගාව තුලින් රටේ සමාජ ආර්ථික වර්ධනයට දායක වීම.
- දේශීය හා විදේශීය ඉල්ලුමට සරිලන අයුරින් රබර් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
- වැඩි අස්වනු ලබා දෙන නව ක්ලෝන හඳුන්වා දීම හා ඒවා ප්‍රචලිත කිරීම තුලින් ස්වභාවික රබර් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට දායක වීම.
- රබර් නැවතවගා හා නවවගා සහනාධාර යටතේ රබර් ගොවීන්ට රබර් වගාවට මූලාධාර සැපයීම, කෘෂි කාර්මික යෙදවුම් හා කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම මගින් විශේෂයෙන් සුළු පරිමාන රබර් ගොවීන්ගේ රබර් නිෂ්පාදනය ප්‍රමාණාත්මක ගුණාත්මක වර්ධනයට දායක වීම.

### ක්‍රියාකාරකම්

- රබර් වගා ඉඩම් හිමියන් ලියාපදිංචිය හා ලියාපදිංචි ඉඩම් තොරතුරු පවත්වා ගෙන යාම.
- රබර් නැවත වගා හා නව වගා සහනාධාර ක්‍රමය යටතේ කුඩා පරිමාන ගොවීන්ට හා ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා රබර් නැවත/ වගා නව වගා අවසර පත්‍ර නිකුත් කිරීම.
- නිර්දේශිත රබර් ක්ලෝනවලින් සුළු පරිමාන රබර් ගොවීන්ගේ වගාවට අවශ්‍ය රබර් පැල නිෂ්පාදනය කිරීම.
- බලපත්‍රලාභී ගොවීන්ට රබර් පැල, රසායනික පොහොර, කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම.
- වාණිජ රබර් පැල තවාන් පිහිටුවීමට අවසර පත්‍ර ලබා දීම.

- රබර් කර්මාන්තශාලා නවීකරණය හා පැල තවාන් සංවර්ධනයට වැවිලි සමාගම් සඳහා ආධාර සැපයීම.
- කිරි කැපුම් කරුවන් හා බද්ධ කරුවන් පුහුණු කිරීම.
- දේශීය රබර් නිෂ්පාදන අලෙවි වෙළඳසැල් සඳහා බලපත්‍ර ලබා දීම.
- ස්වභාවික රබර් කිරි හා රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයන් ලියාපදිංචි කිරීම.
- අපනයනකරුවන්ගෙන් හා දේශීය රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන මත සෙස් බදු එකතු කිරීම.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංක | ෆැක්ස් අංක | ඊමේල් |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්, විමල් රූබසිංහ මයා | 011-2304812 | 011-2304813 | rubberdg@sltnet.lk |
| අධ්‍යක්ෂ සංවර්ධන | 011-2304815 | 011-2304815 | - |
| අධ්‍යක්ෂ පාලන, කේ.වී.පී.ජේ. ගමගේ මිය | 011-2395562 | - | - |
| අධ්‍යක්ෂ මුදල් | 011-2303876 | 011-2303876 | - |
| කාර්යාලය | 011-2395561 | - | - |

**වෙබ් අඩවිය:** www.rubberdev.gov.lk